# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2255/21 - 2021 නොවැම්බර් මස 24 වැනි බදාදා - 2021.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : DS/GFG/L&L/04/77-1.

ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය : 4-3/9/2015/WS/209.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 103ඒ, ගිංතොට නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ දඩල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මු.පි.ගා. 4596 හා 2021.07.30 දිනැති පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 1.7706ක් පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි තුනකි:

01. කැබැලි අංකය 01

ඉඩමේ නම: කනත්ත නොහොත් කනත්ත වත්ත සහ දෙනිය කනත්ත; විස්තරය: ලඳු කැලය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: මහවිතාන නිහාල්, අංක 34/06, ශ්‍රී පියරතන මාවත, ගිංතොට, ගාල්ල, ඩබ්ලිව්. ජන්න ජයනාත්, අංක 440/1, උඩුවත, ගිංතොට, ගාල්ල හා අසංක චන්ද්‍රසේකර, අංක 456/18, කනත්ත වත්ත, ගිංතොට; ප්‍රමාණය:හෙක්ටයාර් 1.0714

02. කැබැලි අංකය 02

ඉඩමේ නම: කනත්ත *නොහොත්* කනත්ත වත්ත සහ දෙනිය කනත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 20-25 වයසැති මිශ්‍ර බෝග වගාවක්, ස්ථිර ගොඩනැගිල්ලක්, සිමෙන්තියෙන් බඳින ලද වැසිකිළියක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිං දෙකක් ඇත.; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ඩයනා නිරෝෂනී පෙරේරා, අංක 456/18, කනත්ත වත්ත, ගිංතොට, ගාල්ල; ප්‍රමාණය:හෙක්ටයාර් 0.2962

03. කැබැලි අංකය 03

ඉඩමේ නම: කනත්ත *නොහොත්* කනත්ත වත්ත සහ දෙනිය කනත්ත; විස්තරය: කුඹුර; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය:හෙක්ටයාර් 0.4030

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021.12.27 වැනි දින පෙ.ව. 10.00ට ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තව ද 2021.12.26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**අයි. හිමාලි රත්නවීර,**
ප්‍රාදේශීය ලේකම් ,
ගාල්ල - කඩවත්සතර.

2021 නොවැම්බර් මස 20 වැනි දින,
ගාල්ල - කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-115

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.